# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | ඒකකය 4 - II |
|---|---|---|

## 4 ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන (ශුද්ධ ලාභය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය)

- අංක 01 සිට 12 තෙක් දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

(1) පහත සඳහන් ගිණුම් අතුරින් වියදම් ගිණුම් පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
1) වැටුප්, බැංකු ණය, වරිපනම්
2) වැටුප්, බැංකු ණය පොළී, විදුලි ගාස්තු
3) ගැනිලි, ගෙවූ පොළී, විදුලි ගාස්තු
4) ගැනිලි, වැටුප්, බැංකු ණය පොළී

- පහත දී ඇති තොරතුරු ඇසුරින් 02, 03, 04 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A – වැටුප් | E – දුන් වට්ටම් |
| B – ප්‍රචාරණය | F – ගොඩනැගිලි කුලී |
| C – බැංකු ණය | G – පොළී ආදායම් |
| D – ලද වට්ටම් | H – මුදල් |

(2) ඉහත අයිතම අතුරින් ආදායම් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1) A, H 2) G, H 3) D, H 4) D, G

(3) E හා F පිළිවෙලින් අයත් වන වියදම් වර්ගයක් වන්නේ,
1) බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම්
2) පරිපාලන වියදම්, බෙදාහැරීමේ වියදම්
3) මූල්‍ය වියදම්, පරිපාලන වියදම්
4) වෙනත් වියදම්, පරිපාලන වියදම්

(4) ඉහත අයිතම අතුරින් ලාභ හෝ අලාභ ප්‍රකාශය සකස් කිරීමේ දී ඇතුළත් නොවන සංරචක ඇතුළත් පිළිතුර වන්නේ,
1) C, D පමණි 2) C, H පමණි 3) D, E පමණි 4) G, H පමණි

(5) පහත දී ඇති වියදම් ගිණුම් අතරින් මූල්‍ය වියදම් යටතට අයත් වන වියදම වන්නේ,
1) මුදල් වංචා අලාභ 2) ගිණි හානි 3) බැංකු ගාස්තු 4) ලිපි ද්‍රව්‍ය වියදම්

- ව්‍යාපාරයක ගිණුම් කාලච්ඡේදයක් තුළ ලැබූ ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත වේ. එම තොරතුරු සැලකිල්ලට ගෙන 06, 07, 08 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| විකුණුම් | රු. 450 000 |
| ලද වට්ටම් | රු. 15 000 |
| විකිණීම සඳහා ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය | රු. 332 000 |
| පොළී ආදායම් | රු. 20 000 |
| ගොඩනැගිලි කුලී ආදායම් | රු. 40 000 |
| අවසාන තොගය | රු. 10 000 |

(6) මෙම ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය වනුයේ,

1) රු. 118 000 2) රු. 332 000 3) රු. 322 000 4) රු. 128 000

(7) මෙම ව්‍යාපාරයේ දළ ලාභය වනුයේ,

1) රු. 128 000 2) රු. 322 000 3) රු. 118 000 4) රු. 188 000

(8) මෙම ව්‍යාපාරයේ වෙනත් ආදායම් වල එකතුව වනුයේ,

1) රු. 510 000 2) රු. 470 000 3) රු. 60 000 4) රු. 75 000

(9) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක මූලිකාංග ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,

1) වත්කම්, හිමිකම්, වියදම් 2) වත්කම්, ආදායම්, වගකීම්
3) වත්කම්, වියදම්, ආදායම් 4) වත්කම්, හිමිකම්, වගකීම්

- '' A නිසා හිමිකමෙහි සිදුවන අඩුවීම් හැරුණු විට හිමිකමෙහි සිදුවන අනෙකුත් අඩුවීම් වියදම් ලෙස හැඳින්වේ.''

(10) මෙහි ''A'' යන ස්ථානයට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,

1) ප්‍රාග්ධනය 2) අලාභ 3) ගැනිලි 4) දුන් වට්ටම්

(11) ගිහාන්ගේ ව්‍යාපාරයේ 2019 වර්ෂයට අදාළ තොරතුරු කිහිපයක් ඔබ වෙත ලබා දී ඇත.

| | | | |
|---|---|---|---|
| විකුණුම් | රු. 700 000 | පරිපාලන වියදම් | රු. 425 000 |
| දළ ලාභය | රු. 550 000 | මූල්‍ය වියදම් | රු. 30 000 |
| වෙනත් ආදායම් | රු. 150 000 | වෙනත් වියදම් | රු. 20 000 |
| බෙදාහැරීමේ වියදම් | රු. 175 000 | | |

ගිහාන්ගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වනුයේ,

1) රු. 1 400 000 2) රු. 750 000 3) රු. 500 000 4) රු. 50 000

- රමණිගේ ව්‍යාපාරයේ 2019. 12. 31 දිනට පැවති වත්කම් කිහිපයක් පහත දැක්වේ.

A – ගොඩනැගිලි
B – ණයගැතියෝ
C – මෝටර් රථ
D – බැංකු මුදල්
E – ලී බඩු උපකරණ
F – අතැති මුදල්
G – ස්ථාවර තැන්පතු

(12) ඉහත වත්කම් අතුරින් ජංගම වත්කම් යටතට අයත් වනුයේ,

1) A, C හා E පමණි 2) B, D හා F පමණි 3) B, D හා G පමණි 4) B, C, E හා G පමණි

(ල. 2 x 12)

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) රහල්ගේ ව්‍යාපාරයේ ගිණුම් කාලච්ඡේදය 2019.12.31 න් අවසන් වේ. පහත තොරතුරු ඔබ වෙත ලබා දී ඇත.

- ගොඩනැගිලි කුලී වියදම්
- රක්ෂණ ගාස්තු
- බැංකු ගාස්තු
- මුදල් වංචා අලාභ
- දුරකථන ගාස්තු
- ගෙන යාමේ කුලී
- ගොඩනැගිලි ක්ෂය
- බැංකු අයිරා පොලී
- විදුලි වියදම්
- ප්‍රචාරණ වියදම්
- කාර්යාල උපකරණ ක්ෂය
- දූන් වට්ටම්

ඉහත සඳහන් වියදම් පහත ශීර්ෂ යටතේ වර්ග කර දක්වන්න.

| බෙදාහැරීමේ වියදම් | පරිපාලන වියදම් | මූල්‍ය වියදම් | වෙනත් වියදම් |
|---|---|---|---|
| | | | |

(2) නවීන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කාලච්ඡේදය 2018. 12. 31 න් අවසන් වන අතර එම වර්ෂයට අදාළ පහත තොරතුරු ඔබ වෙත ලබා දී ඇත.

| | | | |
|---|---|---|---|
| දළ ලාභය | රු. 300 000 | බොල් ණය | රු. 3 000 |
| බැංකු ගාස්තු | රු. 20 000 | රක්ෂණ ගාස්තු | රු. 10 000 |
| ප්‍රචාරණ වියදම් | රු. 15 000 | විදුලි වියදම් | රු. 12 000 |
| වෙනත් ආදායම් | රු. 20 000 | ලිපි ද්‍රව්‍ය වියදම් | රු. 5 000 |

පහත සඳහන් අයිතම වෙන වෙනම ගණනය කරන්න.

i) බෙදා හැරීමේ වියදම්

ii) පරිපාලන වියදම්

iii) ශුද්ධ ලාභය

(3) නවීන්ගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට ශේෂ පිරික්සුම පහත වේ.

| ගිණුමේ නම | හර | බැර |
|---|---|---|
| 2018.01.01 දිනට තොගය | 7 000 | |
| ගැනුම් | 146 000 | |
| ගෙන ඒමේ කුලී | 5 000 | |
| පැටවුම් ගාස්තු | 4 000 | |
| විකුණුම් | | 450 000 |
| ස්ථාවර තැන්පතු 10% | 50 000 | |
| ස්ථාවර තැන්පතු පොළී ආදායම් | | 5 000 |
| යන්ත්‍ර හා උපකරණ | 130 000 | |
| ලද වට්ටම් | | 9 000 |
| දුන් වට්ටම් | 6 000 | |
| රක්ෂණ ගාස්තු | 5 000 | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 5 000 | |
| ප්‍රචාරණ වියදම් | 20 000 | |
| වෙළෙඳ සේවක වේතන | 40 000 | |
| කඩ කුලී වියදම් | 26 000 | |
| ණය ගැතියෝ | 50 000 | |
| බොල් ණය | 2 000 | |
| මුදල් ශේෂය | 60 000 | |
| බැංකු අයිරාව | | 20 000 |
| 10% බැංකු ණය | | 60 000 |
| බැංකු ණය පොළී | 6 000 | |
| බැංකු අයිරා පොළී | 2 000 | |
| ප්‍රාග්ධනය | | 20 000 |
| | 564 000 | 564 000 |

සටහන : මිලදී ගත් තොග සියල්ලම විකිණී ඇත.

අවශ්‍ය වන්නේ,

i) 2018.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය.

ii) 2018.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.